SJSD 2021 1 (2): 08-19

**SRI LANKA JOURNAL OF SOCIAL DEVELOPEMENT** (SJSD)
**Volume 01 – Issue 02**

# ශ්‍රී ලංකාවේ දරිද්‍රතාවය පිටුදැකීමේ වැඩසටහන්වල ප්‍රගතිය පිළිබඳ විමර්ශනය කිරීම

***Dinusha Malshani H. G.[1]***
***Eurasian International Institute of Higher Education, Sri Lanka***

**සාරාංශය**

ස්වෛරී රාජ්‍යයක් ලෙස දශක හතක් පමණ පසු කළ ද ශ්‍රී ලංකාව තවමත් අවිච්ඡින්න වෘද්ධි මාර්ගයකට නිසිලෙස ප්‍රවිෂ්ටව නැත. ඒ හේතුවෙන් ශ්‍රී ලංකා ආර්ථිකය විවිධ දුෂ්කරතාවන්ට මුහුණ පා ඇත, දරිද්‍රතාව මේ අතර ප්‍රමුඛ ස්ථානයක් ගනියි. මෙම ගැටළුවට විසඳුම් සෙවීමට ප්‍රතිපත්ති සම්පාදකයන් විසින් විවිධ ක්‍රමෝපායන් ක්‍රියාත්මක කරන ලදි. එලෙස ක්‍රියාත්මක කරන ලද එක් වැඩසටහනක් ලෙස සමෘද්ධි වැඩසටහන හඳුනා ගත හැකිය. ඒ තුළින් ආර්ථික වෘද්ධියක් ඇති කිරීම, මානව ප්‍රාග්ධන සංවර්ධනය හා සහභාගීත්ව සංවර්ධනය හරහා දිළිඳු ජනතාව සවිබල ගැන්වීම ප්‍රධාන අරමුණ කොට ගෙන ඇත. සමෘද්ධි වැඩසටහන තුළ ක්‍රියාත්මක වැඩසටහන් දිළිඳු ජනතාවගේ පරිභෝජනය මෙන්ම නිෂ්පාදනය ද අරමුණු කොටගෙන ක්‍රියාත්මක වී ඇත. දරිද්‍රතාවය පිටුදැකීම සඳහා ආහාර මුද්දර ක්‍රමය, ජනසවිය, වැනි වැඩසටහන් ක්‍රියාත්මක වුවද ඒවා අපේක්ෂිත ප්‍රතිඵල පූර්ණය කර නොමැති වීමත් සමග සමෘද්ධි වැඩසටහන ක්‍රියාත්මක විය. සමෘද්ධිය තුළක්‍රියාත්මක වන ජීවනෝපාය සංවර්ධන වැඩසටහනදරිද්‍රතාවය පිටුදැකීමේ ක්‍රියාවලියට කොතරම් දුරකට දයකවී ඇත්ද? එහි මූලික අරමුණු වලට ළඟා වීමට පවතින බාධක මොනවාද?, එහි ප්‍රතිලාභ සැබෑ දිළිඳු පවුල් කරා ළඟා වනවාද? යන්න විමසා බැලීම මෙම අධ්‍යයනයේ අරමුණු වේ. එමඅරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා සමෘද්ධි වැඩසටහනට සම්බන්ධව කටයුතු කරන රාජ්‍ය නිළධාරීන් හා අහඹු ලෙස තෝරා ගන්නා ලද ප්‍රතිලාභීන්  හා බැංකු ප්‍රතිලාභීන්ගෙන් සම්මුඛ සාකච්ඡාවක් හා ප්‍රශ්නාවලියක් මගින් ප්‍රාථමික දත්තයන් ද දෙපාර්තමේන්තු දත්ත මගින් ලබා ගත් ද්වීතීක දත්තයන් ද මීට පාදක කර ගනී. සංඛ්‍යානමය දත්ත පරීක්ෂාවක් මඟින් සමෘද්ධි වැඩසටහනේ මූලික අරමුණු සාක්ෂාත් කර ගැනීම පරීක්ෂා කරයි. එහි ක්‍රියාත්මක ජීවනෝපාය සංවර්ධන වැඩසටහන් වලට සම්බන්ධවීම හා ප්‍රතිලාභී ආදායමත් මෙම වැඩසටහන් වලට සම්බන්ධවීමට ප්‍රතිලාභීන්ගේ රුචිකත්වය අතර වෙසෙසි බලපෑමක් හදුනා ගත හැකිය. ජීවනෝපාය සංවර්ධන වැඩසටහන් වලට සම්බන්ධවීම හා ප්‍රතිලාභී විරැකියාව අතර හා ප්‍රතිලාභී ඉතුරුම් අතර සම්බන්ධතාවයක් නොමැති බව දත්ත විශ්ලේෂණයේ දී හඳුනා ගන්නා ලදී. සමෘද්ධි වැඩසටහන ආරම්භ කොට දශක දෙකක් පමණ ගතවී ඇති නමුත්

දරිද්‍රතාවය මුලින් උපුටා දැමීමක් සිදු නොවූ බව සංඛ්‍යා ලේඛන වාර්තා මගින් තහවුරු වේ. ඒ අනුව තවමත් සමාජය තුළ දරිද්‍රතාවය ප්‍රධාන ගැටලුවක් ලෙස පවතී.

**මුඛ්‍ය පද :** ආර්ථික වර්ධනය, දරිද්‍රතාවය, දරිද්‍රතාවය පිටුදැකීමේ වැඩසටහන්, සමෘද්ධි වැඩසටහන

**හැඳින්වීම**

නිදහසේ සිට මෙරට ආර්ථික ප්‍රතිපත්තීන් ක්‍රමක්‍රමයෙන් ආවෘත මට්ටමක් දක්වා ගමන් කරන ලදී. එහි උච්චතම තත්වය 1970-1977 කාලය තුළ දැකිය හැකිය.ආවෘත ආර්ථික ක්‍රමවේදයකට හිමිකම් කියන ලද ශ්‍රී ලංකාවේ 1977 දී සිය විවෘත ආර්ථික ප්‍රතිපත්ති සමග සමාජවාදී ක්‍රමවේදයේ සිට ලිබරල්වාදී ආර්ථික ක්‍රමයකට මාරු විය(ප්‍රනාන්දු, 2011, පි:73). ඒ වන විටත් සමාජය තුළ දරිද්‍රතාවය මුල්බැසගෙන තිබුණි. ඒ සඳහා විවිධ ප්‍රතිපත්තිමය වැඩසටහන් ආරම්භ කරන්නට යෙදුණි. ඒවා ආර්ථික වෘද්ධිය උපායමාර්ග මූලික කොට ගෙන සකස් වූව ද එහි අපේක්ෂිත ප්‍රතිඵල ළඟා කර ගත නොහැකි විය. ආර්ථික වෘද්ධි ප්‍රතිඵලයන් දිළිඳු ජනතාවට සම්ප්‍රේෂණය වන ක්‍රමවේදයක් හරහා සහස්‍ර සංවර්ධන අභිමතාර්ථ ක්‍රියාවට නංවන ලදි. ඒ හරහා දරිද්‍රතාවයට පිළියම් සෙවීමට ප්‍රතිපත්ති සම්පාදකයන්ගේ අවධානය යොමු විය. එහි දී සංවර්ධන ප්‍රවේශයක් හරහා ආර්ථික වෘද්ධිය වේගවත් කර ගැනීම සඳහා දිළිඳු සහන වැඩසටහන් ක්‍රියාත්මක විය. ඒ හරහා සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත දියුණු කිරීම, යටිතල පහසුකම් සංවර්ධනය, දරිද්‍රතාවෙන් පෙළෙන ජනගහනය සවිබල ගැන්වීම, දරිද්‍රතාවෙන් පෙළෙන ජනතාවගේ මූල්‍ය පහසුකම් සංවර්ධනය කිරීම, ආදී විවිධ වැඩසටහන් ක්‍රියාත්මක විය. මෙලෙස ක්‍රියාත්මක වූ වැඩසටහන් ලෙස ආහාර මුද්දර වැඩසටහන, ජනසවිය වැඩසටහන හඳුන්වා දිය හැකිය. ඒවා අපේක්ෂිත ප්‍රතිඵල කරා ළඟා නොවීම හේතුවෙන් වර්තමානය තුළ (1995 සිට) ද දරිද්‍රතාවය අවම කිරීමේ වැඩසටහනක් ලෙස සමෘද්ධි වැඩසටහන ක්‍රියාත්මක වේ. නමුත් දරිද්‍රතා උපනතීන් සංඛ්‍යාත්මකව පහළ අගයන් නිරූපනය කළ ද දරිද්‍රතාවය අවම කිරීමේ වැඩසටහනක් ලෙස සමෘද්ධි වැඩසටහන තුළ ප්‍රතිලාභීන් ප්‍රමාණය ඉහළ ගොස් ඇත(ප්‍රනාන්දු, 2011පි:12). ඒ අනුව සමෘද්ධි වැඩසටහන තුළින් දරිද්‍රතාවය පිටුදැකීමේ ක්‍රියාවලියට කොතරම් දුරකට දයකවී ඇත්ද?,එහි ප්‍රතිලාභ සැබෑ දිළිඳු පවුල් කරා ළඟා වනවා ද?, නොඑසේ නම් එහි මූලික අරමුණු වලට ළඟා වීමට බාධක පවතී ද යන ගැටළු හඳුනා ගත හැකිය. දරිද්‍රතාවය අවම කිරීමේ වැඩසටහනක් ලෙස සමෘද්ධි වැඩසටහන එහි මූලික අරමුණට ළඟා වී ඇතිද? යන්න මෙහිදී අධ්‍යයනය කරනු ලබයි. සමෘද්ධි වැඩසටහනේ දරිද්‍රතා අවම කිරීමේ මූලික අරමුණ සාක්ෂාත් කර ගැනීමට ජීවනෝපාය සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කරනු ලබයි. එමඟින් ප්‍රතිලාභී ආදායමට, ඉතුරුම් වලට හා විරැකියාව කෙරෙහි කවර බලපෑමක් ඇති කරනු ලබනු ඇතිද යන්න පරීක්ෂා කරනු ලබයි. තවද ජීවනෝපාය සංවර්ධන වැඩසටහන් වලට සම්බන්ධවීමට දක්වන රුචිය පිළිබඳව ද අධ්‍යයනය කරනු ලබයි. දත්ත රැස් කිරීමේදී ප්‍රාථමික දත්ත මෙන්ම ද්විතීයික දත්ත ද උපයෝගී කර ගනී. සමෘද්ධි සමිති වල වාර්තා සමෘද්ධි දෙපාර්තමේන්තු දත්ත වාර්තා ජන හා සංඛ්‍යාලේඛන වාර්තා මෙහි ද්විතීක දත්ත ලෙස යොද ගනී.ප්‍රාථමික දත්ත රැස් කිරීමේ දී මාලිම්බඩප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ග්‍රාම නිළධාරී වසම් අතරින් වැඩිම ප්‍රතිලාභීන් සිටින වසම, අඩුම ප්‍රතිලාභීන් සිටින වසම, හා මධ්‍යස්ථ ප්‍රමාණයක් සිටින වසම් 3ක් සංගණනය ලෙස තෝරා ගන්නා ලදී. මෙහිදී බැංකු හා සහනාධාර ප්‍රතිලාභීන්ගෙන් 150 දෙනෙකු මෙම නියැදියට අයත් වේ. මෙම ප්‍රතිලාභීන් සමග හා සමෘද්ධි වැඩසටහනට සම්බන්ධව කටයුතු කරන රාජ්‍ය නිලධාරින් කරන ලද ව්‍යුහගත සම්මුඛ සාකච්ඡා, කණ්ඩායම් සාකච්ඡා හා නිරීක්ෂණ ක්‍රමවේද ඇසුරින් දත්ත රැස්කර ගන්නා ලදී. එම දත්ත කයි වර්ග පරීක්ෂාවක් මගින් පරීක්ෂා කරනු ලබයි.

**දරිද්‍රතාවය**


සමාජයේ විවිධ ආයතන, පුද්ගලයන් හා සංවිධාන, සංවර්ධන උපනතීන් ඉදිරිපත් කොට ඇති අතර එම උපනතීන්ට ළඟා නොවන ජනගහනය දරිද්‍රතාවෙන් පෙළෙන ජන කොටස් ලෙස හඳුනා ගනී. මෙම ආයතන, පුද්ගලයන් හා සංවිධාන විසින් විවිධ සාධනීය මට්ටම් දරිද්‍රතාවය මිනුම් කිරීමට යොදා ගන්නා අතර ඒට නිර්වචනයන් ද ඉදිරිපත් කොට ඇත. ආර්ථික විද්‍යාඥයින් හා සමාජ විද්‍යාඥයින් දරිද්‍රතාව තම විෂය පථයට අනුව නිර්වචනය කොට ඇත.

එම නිර්වචනය දරිද්‍රතාවයේ ස්වභාවයේ ලක්ෂණ හා දරිද්‍රතාවයට බලපාන ලද හේතු පදනම් කොට ගෙන විවිධත්වයක් ගෙන ඇත. ලෝක බැංකුවේ සංවර්ධන වාර්තාවේ දරිද්‍රතාවය ලෙස අර්ථ දක්වා ඇත්තේ සුබ භාවයේ විනීතතාවය  ලෙසයි (අතපත්තු,2011, පි:124). ලෝක ආහාර සංවිධානය ට අනුව දරිද්‍රතාවය යනු දිනක ආහාර වේලක අවම කැලරි ප්‍රමාණය ලබා ගැනීමට ප්‍රමාණවත් ආදායමක් නොලබන පිරිස ලෙස දක්වා ඇත. එසේම එක්සත් ජාතීන්ගේ සංවිධානයේ අර්ථකථනයට අනුව දරිද්‍රතාවය යනු ඇමරිකානු ඩොලර් 1ට වඩා අඩු හෝ දිනකට ඇමෙරිකානු ඩොලර් 2ට වඩා අඩු ආදායමක් ලබන ජනකොටසයි. ආසියානු සංවර්ධන බැංකුවට අනුව "සෑම මනුෂ්‍යයෙකුටම හිමිකමක් ඇති අත්‍යවශ්‍ය වත්කම් සහ අවස්ථා අහිමි වීම දරිද්‍රතාවයයි" එහිදී දරිද්‍රතාවයේ මූලික ප්‍රභේද 3ක් හඳුනා ගනියි. ඒවා නම් මානව, ආදායම්, හා නිරපේක්ෂ දරිද්‍රතාවයයි (ප්‍රනාන්දු,2011,පි:72) දරිද්‍රතාවය ප්‍රභේද 5ක් රොබට් චේම්බර්ස් දක්වනු ලබයි. එනම් ආදායම් දරිද්‍රතාවය, කායික දුබලතාවය, පීඩනයට ගොදුරුවීමේ නැඹුරුතාවය, බලරහිතබාවය,හුදෙකලා වීම ආදිය වේ. මෙම අංශයන්ගේ පවතින සම්බන්ධතාව හේතුකොටගෙන දරිද්‍රතාවය තවදුරටත් තීව්‍ර කරමින් ඔවුන් විහීනතා පාෂයකට නතු වේ (අතපත්තු,2011,පි:124 ).

### දිළිඳු බවේ විෂම චක්‍රය

රැග්නාර් නර්කස් නම් ආර්ථික විද්‍යාඥයාට අනුව දිළිඳු බව සමාජය තුළ ජනිත වීමට පහත චක්‍රයේ බලපෑමක් පවතින බව පෙන්වා දෙයි (හීදැල්ලආරච්චි,2011,පි:12).

**රූප සටහනක් අංක 01**




(හීදැල්ලආරච්චි, 2011,පි:73)

දරිද්‍රතා උපනතීන් ඉවත් කිරීමට නම් විෂම චක්‍රයේ යම් අවස්ථාවක් බිඳ දැමිය යුතුය. මැදි ආදායම් ලබන රටක් ලෙස ශ්‍රී ලංකාවේ ආර්ථික වෘත්තීය ජනගහන සංවර්ධනයට නොගැලපීමත්, කුටුම්බවල ඒක පුද්ගල පරිභෝජනය ඉහළ යාමත්,  හේතුවෙන් ඉතුරුම් අගය පහළ මට්ටමක පවතී. මෙම අඩු ඉතුරුම් ආයෝජන මට්ටම පහළින් තීරණය කරන අතර නිෂ්පාදන පහළ වැටීමට ද හේතු සාධක වේ.

### දරිද්‍රතාවය මිනුම් කිරීම

සාමාජීය හා ආර්ථික දෘෂ්ටිකෝණයට අනුව දරිද්‍රතාවය විවිධ ලෙස මිනුම් කරනු ලබයි. ශ්‍රී ලංකාවේ දරිද්‍රතාවය මිනුම් කරනු ලබන්නේ නිල දරිද්‍රතා රේඛාව මගිනි(අතපත්තු,2011, පි:125). එසේ වුවද තවත් මිනුම් කිහිපයක් ඒ සඳහා යොදා ගනී. දළ ජාතික නිෂ්පාදිතයේ අගය, ආයු අපේක්ෂණය, ළදරු මරණ හා මාතෘ මරණ, සාක්ෂරතාවය වැනි නිර්ණායක ඊට පදනම සපයනු ලබයි. තවද මූලික මිනිස් අවශ්‍යතා සපුරා ගන්නා ආකාරය, යටිතල

පහසුකම් වල ස්වභාවය හා සෞඛ්‍ය තත්ත්වය ද දරිද්‍රතාවය මිනුම් කිරීමට යොදා ගනී. මෙලෙස දරිද්‍රතාවය මිනුම් කිරීමට යොදා ගන්නා නිර්ණායක ප්‍රදේශයෙන් ප්‍රදේශයට රටකින් රටකට වෙනස් විය හැකියි.

**දරිද්‍රතාවය පිටු පිටුදැකීමට ක්‍රියාත්මක වැඩ වැඩසටහන්**

ජනගහන වර්ධනයට සාපේක්ෂව ආර්ථික වර්ධන අනුපාතය ප්‍රමාණවත් නොවීම තුළ ජනගහනයේ පරිභෝජන වියදම ඉහළ යන අතර ආදායම පහළ මට්ටමක තීරණය වේ. එම පහළ ආදායම් මට්ටම ඉතුරුම් මට්ටම අඩු කිරීමට ද හේතු සාධක වේ. ආර්ථිකයක ප්‍රාග්ධන සම්පාදනයට මූලාශ්‍ර සපයන ඉතුරුම් සෘණ අගයක් ගැනීම ප්‍රාග්ධනය අඩු වීම කෙරෙහි බලපායි. අඩු ප්‍රාග්ධනය නිෂ්පාදන ව්‍යුහය අඩපණ කිරීමට සමත් වේ. මෙම විෂම චක්‍රය බිඳ දැමීම සඳහා ශ්‍රී ලංකාව නිදහසින් පසු විවිධ ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ග ගෙන ඇත. මෙම ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ග අංශ දෙකක් යටතේ හඳුනාගත හැකිය.

01. පරිභෝජනය මූලික කර ගත් ප්‍රතිපත්තිමය වැඩසටහන්

02. පරිභෝජනය හා නිෂ්පාදනය යන දෙකම මූලික කරගත් ප්‍රතිපත්තිමය වැඩසටහන්

ආර්ථික විද්‍යාඥයන්ට අනුව පරිභෝජනය පමණක් මූලික කරගත් වැඩසටහන් වලට වඩා පරිභෝජන හා නිෂ්පාදන යන අංශ දෙකම මූලික කරගත් වැඩසටහන් දරිද්‍රතාව අවම කිරීමට උපකාරී වේ. ඒ වශයෙන් ගත් කළ ආහාර මුද්දර ක්‍රමය, ජනසවිය වැඩසටහන හා ජනසවිය භාරකාර අරමුදල ආදිය ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක කරන ලද පරිභෝජනය මූලික කර ගත් සවිබල ගැන්වීමේ වැඩසටහන් ලෙස හඳුන්වා දිය හැකිය. පරිභෝජනය හා නිෂ්පාදනය යන දෙකම මූලික කරගත් වර්තමානයේ ක්‍රියාත්මක වන වැඩසටහන සමෘද්ධි වැඩසටහනයි.

**ආහාර මුද්දර ක්‍රමය**

උතුරු නැගෙනහිර පළාත් තුළ ඇතැම් කොටස් වල තාවකාලිකව ක්‍රියාත්මක නොවූ ආහාර මුද්දර ක්‍රමය දිස්ත්‍රික්ක 17ක සක්‍රීය ලෙස ක්‍රියාත්මක විය. පළමු අදියරේ දී ආහාර මුද්දර පවුල් 1886194ක් වූ නමුත් වැඩසටහන ප්‍රතිව්‍යුහගත කිරීමත් සමඟ වර්ගීකරණය කරන ලද දිළිඳු පවුල් අතරින් පවුල් 769504 ක් තෝරා ගැණින (ගමගේ, 1998, පි:27).

**ජනසවිය වැඩසටහන**

ආහාර මුද්දර ක්‍රමය තුළින් දරිද්‍රතා උපනතීන් අවම නොවීම හේතුවෙන් 1989 අංක 4 දරණ පනත මගින් ඉලක්කගත වැඩසටහනක් ලෙස ජනසවි වැඩ වැඩසටහන් ආරම්භ විය. එහි ප්‍රධාන අරමුණු කිහිපයක් හඳුනාගත හැකිය. දිළිඳු ජනතාව මූලික කොට ගෙන ඔවුන්ගේ දිළිඳු බව, විරැකියාව, පෝෂණ අවශ්‍යතා, සිය කුසලතා, ආකල්ප පදනම් කොට ගෙන සංවර්ධනය කිරීම හා ආර්ථික ස්ථාවරත්වයක් ඒ හරහා ඇති කිරීම පදනම විය.

ජනසවිය වැඩසටහන තුළට ප්‍රතිලාභීන් තෝරා ගැනීම ග්‍රාමීය අංශය තුළින්ම සිදු වූ අතර එහි දී යොදාගත් ආදායම් නිර්ණායක පොදුවේ රජය විසින් ලබාදෙන ලදී. ප්‍රතිලාභීන් තේරීමේදී ආදායම් මට්ටම ලෙස මසකට රුපියල් 700කට වඩා අඩු ආදායමක් උපයන කුටුම්භ මෙහි දී තෝරා ගන්නා ලදී. මෙලෙස තෝරා ගන්නා ලද කුටුම්භ සඳහා වසර 2 කාලයක් සඳහා සිය ආයෝජන හා පරිභෝජන කටයුතු සඳහා මාසික රුපියල් 2500ක දීමනාවක් ලබා දෙන ලදී. මෙම දීමනාවෙන් කොටසක් ඉතුරුම් ලෙස භාවිතා කළ යුතු අතර අනෙක් කොටස පරිභෝජනයට වෙන්විය. මෙලෙස ප්‍රතිලාභ හිමි කුටුම්භ වලට පරිභෝජන භාණ්ඩ ලබා ගැනීමට සමුපකාර ක්‍රමය ක්‍රියාත්මක වූ අතර ආදායම් උත්පාදන ක්‍රියාවලියේ දී වෘත්තීය පුහුණුව ලබා දීම, ස්වයං රැකියා සඳහා ප්‍රාග්ධන ණය ලබා දීම ආදිය සිදු කරන ලදී. මෙම ප්‍රතිලාභ ලබන සෑම කුටුම්භයක්ම තම ශ්‍රමය මසකට ශ්‍රම ඒකක 20 ක දායකත්වයක්

ඵලදායක පොදු වැඩසටහනකට ලබාදිය යුතුය. එසේ නොමැති වීම තම ප්‍රතිලාභය අහිමි වීමට හේතු සාධක වේ (ගමගේ. 1998).

**ජනසවි භාරකාර අරමුදල**

ලෝක බැංකුවේ සත්කාරක වැඩසටහනක් ලෙස 1990 අවසානයේ දී ජනසවි භාරකාර අරමුදල පිහිටුවන ලදී. ග්‍රාමීය ජනතාව සම්බන්ධ කොට ගෙන විරැකියාව අවම කිරීම, පෝෂණ අවශ්‍යතා සම්පූර්ණ කිරීම, මෙම වැඩසටහනේ මූලික අරමුණ විය. රාජ්‍ය බැංකු පද්ධතිය යොදාගෙන මෙම ප්‍රතිලාභීන්ට අවශ්‍ය ණය ලබාදීම සිදුකරන ලදී. මෙම වැඩ වැඩසටහන මගින් ග්‍රාමීය අංශය තුළ විවිධ ප්‍රජා ව්‍යාපෘති ක්‍රියාත්මක කෙරුණි. එම ව්‍යාපෘති සමාජ ආර්ථික සුභසාධන කටයුතු සඳහා යොමු වූ ඒවා වීම විශේෂත්වයකි (ගමගේ 1998,පි:28).

**සමෘද්ධි වැඩසටහන**

ශ්‍රී ලංකාවේ දරිද්‍රතා උපනතීන් අවම කිරීම සඳහා විවිධ වූ පරිභෝජනය ඉලක්ක කරගත් ප්‍රතිපත්ති වැඩසටහන් ක්‍රියාත්මක කරනු ලැබූව ද ඒවා අපේක්ෂිත සාධක මට්ටමට ළඟා නොවීම හේතුවෙන් 1995 දී, සමෘද්ධි ව්‍යාපාරය එවකට රජය විසින් ආරම්භ කරන ලදී. සමෘද්ධි වැඩසටහන පරිභෝජනය හා නිෂ්පාදනය යන දෙකම මූලික කරගත් ප්‍රතිපත්තිමය වැඩසටහනකි. ජනසවිය ව්‍යාපාරය තුළින් පෝෂණය වූ දිළිඳු පවුල් සමෘද්ධි වැඩසටහනට යොමු කෙරුන අතර එය නව ජාතික වැඩසටහනක් ලෙස ක්‍රියාවට නැගුනි. සමෘද්ධි ව්‍යාපාරය තුළ මූලික වූ ප්‍රධාන අරමුණු කිහිපයක් හඳුනාගත හැකිය.

- ⋆ දරිද්‍රතාවය තුරන් කිරීම
- ⋆ දරිද්‍රතාවෙන් පෙළෙන ජන කොටස් ආර්ථික සංවර්ධන ක්‍රියාවලියට සම්බන්ධ කර ගැනීම.
- ⋆ අඩු ආදායම් ලාභීන් සවිබල ගැන්වීම.
- ⋆ දිළිඳු ජනතාවගේ විරැකියාව අවම කිරීම.
- ⋆ ඉතුරුම් පුරුදු ප්‍රවර්ධනය කිරීම.
- ⋆ ස්වයං රැකියා හරහා ජීවනෝපාය මාර්ග සංවර්ධනය කිරීම.

(මූලාශ්‍රයඃ සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තු වාර්තා,2020)

මෙම අරමුණු වලට අනුව සමෘද්ධි ව්‍යාපාරය තුළින් ශ්‍රී ලංකාව් දිළිඳු ජනතාව සවිබල ගැන්වීම් හරහා දිළිඳු බව තුරන් කිරීම මූලික අරමුණ බව හඳුනාගත හැකිය. දිළිදු පවුල් රැක බලා ගනිමින් ඔවුන්ට ඉන් අත්මිදීම සඳහා අවශ්‍ය සහය ලබා දීම මෙම වැඩසටහටනෙන් සිදුකිරීමට බලාපොරොත්තු විය. සහනාධාර වැඩසටහන හා ඉතුරුම් වැඩසටහනෙන් ආරම්භ වූ නමුත් වර්තමානයේ සමෘද්ධි වැඩසටහන ප්‍රධාන අංශ 5 කින් සමන්විත වෙයි.

1 සහනාධාර වැඩසටහන.

2 බැංකු වැඩසටහන.

3 සමාජ ආරක්ෂණ වැඩසටහන

4 සමාජ සංවර්ධන වැඩසටහන

5 ජීවනෝපාය සංවර්ධන වැඩසටහන

සමෘද්ධි වැඩසටහන දිස්ත්‍රික්ක 25 පුරාම සෑම ග්‍රාම නිලධාරී වසමකම ක්‍රියාත්මක වේ. එහිදී රාජ්‍ය නිළධාරීන්ගේ හා ප්‍රජා මූල සමිති සභාපතිවරුන් ගේ ක්‍රියාකාරීත්වය තුළින් මෙම වැඩසටහන් ග්‍රාමීය ජනතාව වෙතට රැගෙන යනු ලබයි. පුද්ගලයා සංවර්ධනය කිරීම වෙනුවට පවුල සවිබල ගැන්වීම මෙහි විශේෂ අවධානයක් යොමු විය. කාන්තාව මූලික කොට ගෙන ආර්ථික හා සමාජීය යන අංශ දෙකෙන්ම සවිබල ගැන්වීම මෙහි දී සිදු විය.

**සහනාධාර වැඩසටහන**

සමෘද්ධි වැඩසටහන තුළ ක්‍රියාත්මක වන සහනාධාර වැඩසටහන දිළිඳු කුටුම්භ වල පරිභෝජන අවශ්‍යතා සපුරා ගැනීම සඳහා මුදල් සහනාධාරයක් ලබා දීම මෙමගින් සිදුකරනු ලබයි. මෙය සමෘද්ධි වැඩසටහනේ මූලික සංකල්පය යි. මෙම වැඩසටහනට වර්තමානයේ ප්‍රතිලාභීන් තෝරා ගනු ලබන්නේ ග්‍රාමීය කමිටුවේ නිර්දේශ මතයි. මෙම ග්‍රාමීය කමිටුව අදාල වසමේ සමෘද්ධි සංවර්ධන නිලධාරින් ප්‍රමුඛ ග්‍රාම නිලධාරි, ආර්ථික සංවර්ධන නිලධාරි, කෘෂිකර්ම පර්යේෂණ නිලධාරී, පවුල් සෞඛ්‍ය සේවා නිලධාරී, සමෘද්ධි ප්‍රජාමූල සංගමයේ සභාපති, ප්‍රදේශයේ මහජන නියෝජිතයා යන සාමාජිකයින්ගෙන් සමන්විත වේ. ශක්‍යතා අධ්‍යයනයක් හරහා දිළිඳු පවුල් හඳුනාගැනීමේ ක්‍රමවේදයක් වර්තමානයේ ක්‍රියාත්මක වේ. තවද ඒ සඳහා ලකුණු ලබා දීමේ ක්‍රමවේදයක් ද පවතී. එහිදී ග්‍රාමීය කමිටු නිර්දේශය අනුව දිළිඳු පවුල් වල ප්‍රමුඛතා ලේඛණයක් සකස් කරනු ලබයි. ඒ හරහා සමෘද්ධි සහනාධාරය ලබා දීමට සුදුසුකම් ලබන පුද්ගලයන් තෝරා ගනු ලැබේ. මෙහි දී ඒක පුද්ගල මාසික ආදායම රුපියල් 5000 අඩු කුටුම්භ ආදයම් නිර්නායකය තුළ හඳුනාගත හැකිය. කුටුම්භ සාමාජිකයන් ප්‍රමාණය මත ලබා දෙන සහනාධාර වටිනාකම තීරණය වේ.

**වගු අංක 1: කුටුම්භ සංඛ්‍යාව අනුව සහනාධාර මුදල**

| **කුටුම්භ සංඛ්‍යාව** | **සහනාධාර මුදල** |
|---|---|
| 1 හෝ 2 | 1500 |
| 2 හෝ 3 | 2500 |
| 3 ට වැඩි | 3500 |

මෙම සහනාධාර මුදල බැංකු ක්‍රමය හරහා ප්‍රතිලාභීන්ට හිමිවේ. මෙම මුළු මුදලම ප්‍රතිලාභීන්ට නොලැබෙන අතර ඉන් අරමුදල් කීපයක් සඳහා මුදල් අය කරනු ලබයි. අනිවාර්ය ඉතිරිකිරීම්, නිවාස ලොතරැයිය, හා සමාජ ආරක්ෂතා වැඩසටහන් සඳහා සහනාධාර මුදලින් නිශ්චිත මුදලක් මාසිකව බැර කරනු ලබයි. එම සියලු අරමුදල් ප්‍රතිලාභීන් ඉලක්ක කොටගත් ඒවා වේ. සමෘද්ධි සහනාධාර ලාභීන් දිස්ත්‍රික්ක අනුව මෙසේ දැක්විය හැකියි.

**වගු අංක 2. සමෘද්ධි සහනාධාර ලාභීන් (2020)**

| දිස්ත්‍රික්කය | ප්‍රතිලාභීන් |
|---|---|
| කොළඹ | 55034 |
| ගම්පහ | 120001 |
| කළුතර | 72760 |
| මහනුවර | 96239 |
| මාතලේ | 53539 |
| නුවරඑළිය | 50864 |
| ගාල්ල | 81131 |
| මාතර | 70861 |
| හම්බන්තොට | 65255 |

| | |
|---|---|
| යාපනය | 76010 |
| මන්නාරම | 23117 |
| වව්නියාව | 23827 |
| මුලතිව් | 24406 |
| කිලිනොච්චිය | 24081 |
| මඩකලපුව | 99690 |
| අම්පාර | 90924 |
| ත්‍රිකුණාමලය | 63136 |
| (කුරුණෑගල | 174460 |
| පුත්තලම | 64433 |
| අනුරාධපුරය | 78334 |
| පොළොන්නරුව | 78334 |
| බදුල්ල | 75091 |
| මොණරාගල | 53771 |
| රත්නපුර | 125288 |
| කෑගල්ල | 67172 |

මූලාශ්‍රය: සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තු සංඛ්‍යා වාර්තා 2020)

**බැංකු වැඩ වැඩසටහන**

සමෘද්ධි සහනාධාර වැඩසටහනට සමගාමීව බැංකු පුරුදු හා ඉතුරුම් වැඩසටහන දිළිඳු කුටුම්භ අතර ප්‍රවර්ධනය කිරීම අරමුණු කොටගෙන බැංකු වැඩසටහන ක්‍රියාත්මක වේ. සමෘද්ධි සහනාධාරය බැංකු ක්‍රමය හරහා ප්‍රතිලාභීන්ට ලබා දෙයි. මූල්‍ය ප්‍රාග්ධන අවශ්‍ය දිළිඳු ජනතාවට කණ්ඩායම් ක්‍රමය හරහා ඇප සුරැකුම් නොමැතිව ඒ අයට මූල්‍ය අවශ්‍යතා ප්‍රතිපූර්ණය කිරීම මෙහිදී සිදුවේ. සාමාජික ඉතුරුම්, කොටස් ඉතුරුම්, අනිවාර්ය ඉතුරුම්, කණ්ඩායම් ඉතුරුම්, සාමාජික නොවන ඉතුරුම්, දිරිය මාතා හා ළමා ඉතුරුම් බැංකු පද්ධතිය තුළ ක්‍රියාත්මක වෙයි. බැංකු පද්ධතිය දිළිඳු ජනතාවගේ මූල්‍ය අවශ්‍යතා සඳහා සහනදායී පොලී අනුපාත හරහා ණය ලබාදීම සිදුකරනු ලබයි. ප්‍රධාන වශයෙන් ජීවන උපාය සංවර්ධන හා ගෘහ ඒකක ණය වර්ග හඳුන්වා දිය හැකිය. බැංකු වැඩ වැඩසටහන තුළට සහනාධාර හිමි නොවන අඩු ආදායම්ලාභී ඕනෑම පුද්ගලයෙකුට කණ්ඩායම් ක්‍රමවේදය හරහා ණය වැඩසටහන හා ඉතුරුම් වැඩසටහනට සම්බන්ධ විය හැකි වීම විශේෂත්වයකි.

(මූලාශ්‍රය: සම්මුඛ සාකච්ඡා සමෘද්ධි බැංකුව, මාලිම්බඩ)

**සමාජ ආරක්ෂණ වැඩ වැඩසටහන**

සමෘද්ධි සහනාධාර වැඩසටහනට ඇතුළත් වන සියලු කුටුම්භ මෙම සමාජ ආරක්ෂණ වැඩසටහන යටතේ ප්‍රතිලාභ ලැබීමට සුදුසුකම් ලබයි. එහිදී ඔවුන්ගේ සහනාධාර මුදලින් රුපියල් 80 ක් මෙම සමාජ ආරක්ෂණ අරමුදලට වෙන් කෙරේ. ඒ ඔස්සේ ඔවුන්ට ප්‍රතිලාභ හිමිවන අංශ මෙසේය

1. දරු උපතක දී(සහනාධාර ලබන කුටුම්බයෙහි සිදුවන දරු උපත් 3 ක් සඳහා එක් දරු උපතකට රු. 10000 ක් බැගින්)

2. මරණයක දී(සහනාධාර ලබන කුටුම්භයේ සාමාජිකයෙකුගේ මරණයක් සඳහා රු. 20000)

3. විවාහයක දී (සහනාධාර ලබන කුම්භයේ සාමාජිකයෙකුගේ විවාහයක් සඳහා රු. 10000 )

4. සිප්දොර ශිෂ්‍යත්ව (සහනාධාර ලබන කුම්භයේ දරුවකුගේ අධ්‍යාපනය සඳහා මාසිකව රු.1500)

5 රෝහල් ගත වීමක් සඳහා (ප්‍රතිලාභී සාමාජිකයෙක් සඳහා එක් දිනකට 350)

සහනාධාර ලබන කුටුම්භ වල මෙම සුවිශේෂී අවස්ථාවන් වලදී සමාජ ආරක්ෂතා වැඩසටහන මගින් මුදල් ලබා දීමක් සිදු කරනු ලබයි.

(මූලාශ්‍රයඃ සම්මුඛ සාකච්ඡා සමෘද්ධිය මූලස්ථානය, මාලිම්බඩ)

**සමාජ සංවර්ධන වැඩසටහන**

සහනාධාර ලබන කුටුම්භ හා අඩු ආදායම්ලාභී කුටුම්භ සඳහා ඔවුන්ගේ සමාජ සවිබල ගැන්වීමේ කාර්ය මෙම වැඩ වැඩසටහන හරහා සිදුකරනු ලබයි. එම වැඩ වැඩසටහන්

1 දිරිය පියස නිවාස වැඩසටහන

2 ආදර්ශ ගම්මාන වැඩසටහන

3 සනීපාරක්ෂතා වැඩසටහන

4 දින සැමරුම් වැඩසටහන්

5 ළමා සමාජ වැඩසටහන්

6 දුම්වැටි නිවාරණ වැඩසටහන්

7 ගෘහ කළමනාකරණය හා පවුල් සංවර්ධනය

8 සාමාජීය හා සංස්කෘතික වැඩසටහන්

ඉහත දැක්වූ අංශ හරහා ප්‍රජාවගේ මානව දරිද්‍රතාවය අවම කිරීම සඳහා ධනාත්මක ප්‍රවේශයක් ලෙස මෙම වැඩසටහන ක්‍රියාත්මක වේ.(මූලාශ්‍රයඃ සම්මුඛ සාකච්ඡා සමෘද්ධි මූලස්ථානය, මාලිම්බඩ)

**ජීවනෝපාය සංවර්ධන වැඩසටහන**

ආරම්භයේ දී සමෘද්ධි සහ අඩු ආදායම් ලාභීන්ගේ ආදායම් තත්ත්වය ඉහළ නැංවීම සඳහා විවිධ වූ ආදායම් උත්පාදන මාර්ග සඳහා අවශ්‍ය ප්‍රාග්ධනය, පුහුණුව, තාක්ෂණික දැනුම ලබාදීම මෙම වැඩසටහන මඟින් සිදුකරනු ලබයි. එහිදී,

1 කෘෂිකාර්මික

2 කාර්මික

3 සත්ව පාලනය

4 සේවා අංශය

ඉහත ක්ෂේත්‍ර සඳහා අවශ්‍ය තාක්ෂණික උපකරණ ලබාදීම, ප්‍රතිලාභී දායකත්වය මත මෙහිදී සිදුකරනු ලබයි. ඊට අවශ්‍ය පුහුණු වැඩමුළු තුලින් දැනුම ලබා දීම තුළ ප්‍රතිලාභීන් සවිබල ගැන්වීම මෙම වැඩසටහන හරහා සිදුකරනු ලබයි. කෙසේ වෙතත් පසුකාලීනව මෙම වැඩසටහන සමෘද්ධි ප්‍රතිලාභීන් ඉලක්ක කරගෙන පමණක් ක්‍රියාත්මක විය.

(මූලාශ්‍රයඃ සම්මුඛ සාකච්ඡා, ජීවනෝපාය සංවර්ධන වැඩසටහන් නිලධාරී, මාලිම්බඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය )

**පර්යේෂණ ක්‍රමවේදය**

මාතර දිස්ත්‍රික්කයේ මාලිම්බඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් ග්‍රාම නිළධාරී වසම් තුළ වැඩිම, අඩුම හා මධ්‍යස්ථ ප්‍රතිලාභීන් ප්‍රමාණය මත ග්‍රාම නිලධාරී වසම් 03 තෝරා ගන්නා ලදී. ඒ අතරින් බැංකු හා සහනාධාර ප්‍රතිලාභීන් 150ක් සරල සසම්භාවී ක්‍රමය යටතේ තෝරා ගන්නා ලදී. නියදිය තෝරා ගැනීමේදී රු:3500, රු:2500, හා රු:420 සහනාධාරලාභීන් පමණක් හා වසර 10කට පෙර සහනාධාර ලැබූ ප්‍රතිලාභීන් පමණක් ඇතුළත් කර ගන්නා ලදී. ජීවනෝපාය සංවර්ධන වැඩසටහනට සම්බන්ධ වු ප්‍රතිලාභීන් හා සවිබල ගැන්විය හැකි ප්‍රතිලාභීන් නියැදියට ඇතුලත් කර ගැනීම එහි අරමුණ විය. සමෘද්ධි සමිති වල වාර්තා සමෘද්ධි දෙපාර්තමේන්තු දත්ත වාර්තා ජන හා සංඛ්‍යාලේඛන වාර්තා මෙහි ද්විතීක දත්ත ලෙස යොදා ගනී. ප්‍රතිලාභීන්ගෙන් සම්මුඛ සාකච්ඡාවක් මඟින් ප්‍රාථමික දත්ත රැස් කරන ලදී. සමෘද්ධි ව්‍යාපාරය තුළ අරමුණු වූ දරිද්‍රතාවය තුරන් කිරීම, දරිද්‍රතාවෙන් පෙළෙන ජන කොටස් ආර්ථික සංවර්ධන ක්‍රියාවලියට සම්බන්ධ කර ගැනීම, ඉතුරුම් පුරුදු ප්‍රවර්ධනය කිරීම, අඩු ආදායම්ලාභීන් සවිබල ගැන්වීම, දිළිඳු ජනතාවගේ විරැකියාව අවම කිරීම, ස්වයං රැකියා හරහා ජීවනෝපාය මාර්ග සංවර්ධනය කිරීම ආදිය කොතරම් දුරකට සාර්ථක වී ඇත් ද යන්න මෙහිදී අධ්‍යයනය කරනු ලබයි. සමෘද්ධි ජීවනෝපාය සංවර්ධන වැඩසටහන් මඟින් ප්‍රතිලාභීන්ගේ ආදායමට, ඉතුරුම් වලට හා විරැකියාව කෙරෙහි කවර බලපෑමක් ඇති කරනු ලබයි ද යන්න හා එම වැඩසටහන් වලට ප්‍රතිලාභීන් සම්බන්ධ වීමට දක්වන කැමැත්ත යන විචල්‍යයන්ගේ හැසිරීම කයි වර්ග පරීක්ෂාවක් මඟින් දක්වනු ලබයි. මෙහි දී යොදාගනු ලබන පරායත්ත විචල්‍යය වන සමෘද්ධි ජීවනෝපාය සංවර්ධන වැඩසටහන් යන විචල්‍යය මෙන්ම ස්වායත්ත විචල්‍යයන් ලෙස ප්‍රතිලාභීන්ගේ ආදායමට, ඉතුරුම් වලට, විරැකියාවට හා ප්‍රතිලාභීන්ගේ රුචිකත්වය යන විචල්‍යයන් ගුණාත්මක විචල්‍යයන් ලෙස හඳුනා ගත හැකිය.

**විශ්ලේෂණය**

සමෘද්ධි ව්‍යාපාරය තුළ අරමුණු වූ දරිද්‍රතාවය තුරන් කිරීම හා අඩු ආදායම්ලාභීන් සවිබල ගැන්වීම යන්න මැන බැලීම සඳහා පහත කල්පිත ගොඩ නගන ලදී.

$H_0$ :ජීවනෝපාය සංවර්ධන වැඩසටහන් වලට සම්බන්ධ වීම ප්‍රතිලාභීන්ගේ ආදායමට බලපෑමක් නොපවතී.

$H_1$ :ජීවනෝපාය සංවර්ධන වැඩසටහන් වලට සම්බන්ධ වීම ප්‍රතිලාභීන්ගේ ආදායමට බලපෑමක් පවතී.

මෙහිදී ඉහත කල්පිතයන්ට අනුව කයි වර්ග සංඛ්‍යාතය 50.385 ක් වන අතර P අගය = 0.000 <a = 0.05 කි. ගණනය කරන ලද a සංඛයාතයට වඩා p අගය අඩුවන බැවින් අප්‍රතිශ්ඨය කල්පිතය ප්‍රතික්ෂේප වේ. ඒ අනුව ජීවනෝපාය සංවර්ධන වැඩසටහන් වලට සම්බන්ධ වීම ප්‍රතිලාභීන්ගේ ආදායමට බලපෑමක් පවතී යන වෛකල්පිතය පිළිගනී.

නියැදිය තෝරා ගැනීමේදී රු:3500, රු:2500, හා රු:420 සහනාධාරලාභීන් පමණක් හා වසර 10කට පෙර සහනාධාර ලැබූ ප්‍රතිලාභීන් පමණක් ඇතුලත් කර ගන්නා ලදී. එවිට වසර 10 ක් සහනාධාර ලැබූවද ප්‍රතිලාභීන් ජීවනෝපාය සංවර්ධන වැඩසටහන් වලට සම්බන්ධ නොවීම හෝ සම්බන්ධ වූවත් ඉන් නිශ්චිත ප්‍රතිපල නොලැබීමත් මඟින් සමෘද්ධි ව්‍යාපාරය තුළ අරමුණු වූ දරිද්‍රතාවය තුරන් කිරීම හා අඩු ආදායම් ලාභීන් සවිබල ගැන්වීමට ලඟා වී නොමැත.

සමෘද්ධි ව්‍යාපාරය තුළ අරමුණු වූදරිද්‍රතාවෙන් පෙළෙන ජන කොටස් ආර්ථික සංවර්ධන ක්‍රියාවලියට සම්බන්ධ කර ගැනීමට ඇති හැකියාව මැන බැලීම සඳහා පහත කල්පිත ගොඩ නගන ලදී.

$H_0$ :ජීවනෝපාය සංවර්ධන වැඩසටහන් වලට සම්බන්ධ වීම ප්‍රතිලාභීන්ගේ රුචිකත්වයට බලපෑමක් නොපවතී.

$H_1$ :ජීවනෝපාය සංවර්ධන වැඩසටහන් වලට සම්බන්ධ වීම ප්‍රතිලාභීන්ගේ රුචිකත්වයට බලපෑමක් පවතී.

මෙහිදී ඉහත කල්පිතයන්ට අනුව කයි වර්ග සංඛ්‍යාතය 7.225 ක් වන අතර P අගය = 0.027 <a = 0.05 කි.ගණනය කරන ලද a සංඛයාතයට වඩා p අගය අඩුවන බැවින් අප්‍රතිෂ්ඨය කල්පිතය ප්‍රතික්ෂේප වේ. ඒ අනුව අප්‍රතිෂ්ඨයේ කල්පිතය ($H_0$) ප්‍රතික්ෂේප කරනු ලබයි. වෛකල්පිතය වන ජීවනෝපාය සංවර්ධන වැඩසටහන් වලට සම්බන්ධ වීම ප්‍රතිලාභීන්ගේ රුචිකත්වයට බලපෑමක් පවතී යන්න පිළිගනී.

සමෘද්ධි වැඩසටහනේ ඇති ජීවනෝපාය සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක වීමේදී කෘෂිකාර්මික, කාර්මික, සත්ව පාලනය, සේවා අංශය වලට ප්‍රමුඛතාවය ලබා දුන්නේ නම් ප්‍රතිලාභීන්ගේ රුචිකත්වයට අනුව ආර්ථික සංවර්ධන ක්‍රියාවලියට සම්බන්ධ කර ගැනීමට හැකි වනු ඇත. එවිට ප්‍රතිලාභීන් ප්‍රමාණය අඩු වනු ඇත.

සමෘද්ධි ව්‍යාපාරය තුළ අරමුණු වූ දිළිඳු ජනතාවගේ විරැකියාව අවම කිරීම, ස්වයං රැකියා හරහා ජීවනෝපාය මාර්ග සංවර්ධනය කිරීම යන්න මැන බැලීම සඳහා පහත කල්පිත ගොඩ නගන ලදී.

$H_0$:ජීවනෝපාය සංවර්ධන වැඩසටහන් වලට සම්බන්ධ වීම ප්‍රතිලාභීන්ගේ විරැකියාව කෙරෙහි බලපෑමක් නොපවතී.

$H_1$ :ජීවනෝපාය සංවර්ධන වැඩසටහන් වලට සම්බන්ධ වීම ප්‍රතිලාභීන්ගේ විරැකියාව කෙරෙහි බලපෑමක් පවතී.

මෙහිදී ඉහත කල්පිතයන්ට අනුව P අගය = 0.166 >a = 0.05 කි. ගණනය කරන ලද a සංඛයාතයට වඩා p අගය වැඩි වන බැවින් අප්‍රතිෂ්ඨයේ කල්පිතය ($H_0$) ප්‍රතික්ෂේප නොකරයි. ජීවනෝපාය සංවර්ධන වැඩසටහන් වලට සම්බන්ධ වීම ප්‍රතිලාභීන්ගේ විරැකියාව කෙරෙහි බලපෑමක් නොපවතී යන්න පිළිගනී.

සමෘද්ධි වැඩසටහන තුලින් තාක්‍ෂණික උපකරණ ලබාදීම, ඊට අවශ්‍ය පුහුණු වැඩමුළු තුලින් දැනුම ලබා දීම තුළ ප්‍රතිලාභීන් සවිබල ගැන්වීම සිදු කරනු ලැබූවද ප්‍රතිලාභීන්ගේ විරැකියාව අවම කිරීමට එය සමත් වී නොමැත.

සමෘද්ධි ව්‍යාපාරය තුළ අරමුණු වූ ඉතුරුම් පුරුදු ප්‍රවර්ධනය කිරීම යන්න මැන බැලීම සඳහා පහත කල්පිත ගොඩ නගන ලදී.

$H_0$ :ජීවනෝපාය සංවර්ධන වැඩසටහන් වලට සම්බන්ධ වීම ප්‍රතිලාභීන්ගේ ඉතුරුම් කෙරෙහි බලපෑමක් නොපවතී.

$H_1$ :ජීවනෝපාය සංවර්ධන වැඩසටහන් වලට සම්බන්ධ වීම ප්‍රතිලාභීන්ගේ ඉතුරුම් කෙරෙහි බලපෑමක් පවතී.

මෙහිදී ඉහත කල්පිතයන්ට අනුව P අගය = 0.399 >a = 0.05 කි. ගණනය කරන ලද a සංඛ්‍යාතයට වඩා p අගය වැඩි වන බැවින් අප්‍රතිෂ්ඨයේ කල්පිතය ($H_0$) ප්‍රතික්ෂේප නොකරයි. ජීවනෝපාය සංවර්ධන වැඩසටහන් වලට සම්බන්ධ වීම ප්‍රතිලාභීන්ගේ ඉතුරුම් කෙරෙහි බලපෑමක් නොපවතී.

සමෘද්ධි සහනාධාර වැඩසටහනට සමගාමීව බැංකු පුරුදු හා ඉතුරුම් වැඩසටහන දිළිඳු කුටුම්භ අතර ප්‍රවර්ධනය කිරීම අරමුණු කොටගෙන බැංකු වැඩසටහන ක්‍රියාත්මක වේ. සමෘද්ධි සහනාධාරය බැංකු ක්‍රමය හරහා ප්‍රතිලාභීන්ට ලබා දෙයි. නමුත් ඒ හරහා ඉතුරුම් වර්ධනය වීමක් හඳුනා ගත නොහැක.

**සමෘද්ධි වැඩසටහනේ සීමාකම්**

සමෘද්ධි ව්‍යාපාරය තුළ සහනාධාරලාභීන් නිවැරදිව ඉලක්ක ගත නොවීම ලෝක බැංකුව විසින් සිදු කරන ලද අධ්‍යයනයක් මඟින් හෙළි කොට ඇත. තවද ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ ගෘහ ඒකක ආදායම් වියදම් සමීක්ෂණය මගින් ද මේ බව තහවුරු වී ඇත. (කළුආරච්චි,2014,පි:31) තවද ශ්‍රී ලංකාවේ වාර්තා වන දිළිඳු කුටුම්භ වලට වඩා වැඩි සමෘද්ධි ප්‍රතිලාභීන් ප්‍රමාණයක් සෑම දිස්ත්‍රික්කයකම වාර්තා වීම තුළ එය නුසුදුසු පුද්ගලයන්ට ලැබී ඇතිය යන සාධකය තහවුරු කරයි(කළුආරච්චි, 2014, පි:37). සමෘද්ධි ව්‍යාපාරය දේශපාලනමය හස්ත මත ක්‍රියාත්මක වීම, එහි අපේක්ෂිත ප්‍රතිඵල කරා ලගා නොවීමට හේතු සාධක වී ඇත. ඒ තුළ ප්‍රතිලාභ ලබන දිළිඳු ජනතාව තුළ පරාධීන මානසිකත්වය වර්ධනය වනවා විනා එහි අපේක්ෂිත ප්‍රතිඵල වන දරිද්‍රතාවය අවම නොවීමත් හඳුනාගත හැකිය. සමෘද්ධිලාභී පවුල් සඳහා සියලු වරප්‍රසාද ලබාදීම. (ජල ගාස්තු අඩුවීම/ විදුලි ගාස්තු අඩුවීම/ ශිෂ්‍යත්ව) හරහා මෙම සහනාධාරය ඉවත් නොවී පවත්වා ගැනීමට ප්‍රතිලාභීන් උත්සාහ දරයි (මූලාශ්‍රයඃ සම්මුඛ සාකච්ඡා ක්ෂේත්‍ර නිළධාරීන් සමෘද්ධි අංශය, මාලිම්බඩ 2021).

**නිගමන**

නිදහසින් පසු කාලය තුළ ශ්‍රී ලංකාවේ දරිද්‍රතාවය තුරන් කිරීම සඳහා විවිධ වැඩසටහවන් ක්‍රියාත්මක වූව ද වර්ථමානයේ ක්‍රියාත්මකවන්නේ සමෘද්ධි වැඩසටහනයි. සමෘද්ධි වැඩසටහනේ ක්‍රියාත්මක ප්‍රධාන වැඩසටහන වන්නේ ජීවනෝපාය සංවර්ධන වැඩසටහනයි. මෙම වැඩසටහනට සම්බන්ධවීමෙන් අඩු ආදායම්ලාභීන් සවිබල ගැන්වේ නම් එය ඔවුන්ගේ ආදායම ඉහළ යාමට හේතු සාධක වේ. ආරම්භයේ පටන් මේ දක්වා වැඩසටහන් ක්‍රියාත්මක වූවද ප්‍රතිලාභීන් ප්‍රමාණය අඩු නොවීම තුළ සිය අරමුණු කරා ලගා නොවූ බව හඳුනා ගත හැකිය. ජීවනනෝපාය සංවර්ධන වැඩසටහන් සකස් විය යුත්තේ, එය දළ දේශීය නිශ්පාදනයට කරන දායකත්වය, පුද්ගලයන් ඊට දක්වන රුචිකත්වය පදනම් කොට ගෙනයි. නමුත් සත්‍ය වශයෙන් සිදුවන්නේ පොදු සාමාන්‍යකරනයක් වටා ප්‍රතිලාභීන් එක් කිරීමයි. එවිට අදාළ ව්‍යාපෘතියෙන් ප්‍රතිලාභීන් ගිලිහී යන අතර එය මෙම වැඩසටහනේ ක්‍රියාකාරීත්වය අකාර්යක්‍ෂම කරයි. ඒකාකාරී වැඩසටහන් සඳහා ප්‍රතිලාභීන් සහභාගී වූව ද එය ඔවුන්ගේ ජීවන වෘත්තිය වෙනස් කිරීමට සැලකිය යුතු බලපෑමක් ඉටු නොකරයි. එය මෙම වැඩසටහන් වල ක්‍රියාකාරීත්වයේ අකාර්යක්‍ෂම බාවය පෙන්නුම් කරයි. ඉතුරුම් හරහා තම වර්තමාන පරිභෝජනය පමණක් නොව අනාගත පරිභෝජනය සඳහා ප්‍රතිලාභීන් හුරු කිරීම තුළ, රට තුළ ආයෝජන අවස්ථා ඉහළ යන අතර එය දිළිඳු බවේ විෂම චක්‍රය බිඳ දැමිය හැකිය. නමුත් සමෘද්ධි වැඩසටහනේ ජීවනෝපාය සංවර්ධන වැඩසටහන් හරහා ඊට අවශ්‍ය සානුබලයක් නොසැපයේ.

ඒ අනුව දරිද්‍රතාවය තුරන් කිරීම සඳහා ක්‍රියාත්මක වූ හා ක්‍රියාත්මක වන වැඩසටහන් සහනාධාරයක් ලබාදීම මූලික කරගෙන ක්‍රියා කරන අතර, පුද්ගල සංවර්ධනයට එහි දායකත්වය අවම වේ.

**සමාලෝචනය**

දරිද්‍රතාවය තුරන් කිරීම හා අඩු ආදායම් ලාභීන් සවිබල ගැන්වීම සමෘද්ධි වැඩසටහන තුළ අරමුණු වූවත් වසර 10 ක් සහනාධාර ලැබූවද ප්‍රතිලාභීන් ජීවනෝපාය සංවර්ධන වැඩසටහන් වලට සම්බන්ධ නොවීම හා සම්බන්ධ වූවත් ඉන් නිශ්චිත ප්‍රතිපල නොලැබීම තුළ පරාධීන මානසිකත්වයක් ගොඩනැගීම පමණක් හඳුනා ගත හැකිය. ජීවනෝපාය සංවර්ධන වැඩසටහන් වලට සම්බන්ධ වීම ප්‍රතිලාභීන්ගේ රුචිකත්වයට බලපෑමක් පැවතීම තුළ නිළධාරීන් කොතරම් උත්සාහ කළ ද සහනාධාරය ඉවත් වේය යන උපකල්පනය නිසා ප්‍රතිලාභීන් ඊට යොමු නොවේ. සමෘද්ධි වැඩසටහන තුලින් තාක්‍ෂණික උපකරණ ලබාදීම, ඊට අවශ්‍ය පුහුණු වැඩමුළු තුලින් දැනුම ලබා දීම තුළ ප්‍රතිලාභීන් සවිබල ගැන්වීම සිදු කරනු ලැබූවද ප්‍රතිලාභීන්ගේ විරැකියාව අවම කිරීමට එය සමත් වී නොමැත. එහි දී ප්‍රතිලාභීන්ගේ විරැකියාව කෙරෙහි තම නිෂ්පාදන වලට නිසි වෙළඳ පොළක් නොතිබීම හා යල් පැන ගිය තාක්‍ෂණික පුහුණු සමෘද්ධි වැඩසටහන අරමුණු වලින් ඈත් කරනු ලබයි. සමෘද්ධි සහනාධාර වැඩසටහනට සමගාමීව බැංකු පුරුදු හා ඉතුරුම් වැඩසටහන දිළිඳු කුටුම්භ අතර ප්‍රවර්ධනය කිරීම අරමුණු කොටගෙන බැංකු වැඩසටහන ක්‍රියාත්මක වූවද සහනාධාරය ඉවත් වේය යන උපකල්පනය නිසා ප්‍රතිලාභීන් ඊට යොමු නොවේ.

දරිද්‍රතාවය අවම කිරීමට ක්‍රියාත්මක වැඩසටහන් වල අරමුණ වූයේ දිළිඳු ජනතාව සවිබල ගැන්වීම හා ඊට අවශ්‍ය ආකල්ප, කුසලතා, දැනුම හා ප්‍රාග්ධන අවශ්‍යතා සපුරාලීමයි. මෙහිදී සමෘද්ධි වැඩසටහන සුවිශේෂී කාර්යභාරයක් ඉටු කරන නමුත් එහි ප්‍රතිලාභීන් නිසිලෙස ඉලක්කගත නොවීමත්, දේශපාලන න්‍යාය පත්‍ර තුළ නව සහනාධාර නිකුත් වීමත්, හේතුවෙන් අපේක්‍ෂිත අරමුණ වැඩසටහනින් බැහැරවේ. සහනාධාර සංකල්පය තුළ පරාධීන මානසිකත්වයක් ඇති වෙන අතර එම සහනාධාරය කාලසීමාවකට සීමා කරයි නම් එම දුර්වලතාවය මඟහරවා ගත හැකිය. විශාල වරප්‍රසාද ප්‍රමාණයක් ප්‍රතිලාභීන් ඉලක්ක කොට ගෙන ඒවා දීර්ඝ කාලයක් එකම කුටුම්භයකට ලබාදීම තුළ දරිද්‍රතා උපනතීන් ඉක්මවා යාමට ඔවුන්ට ඒ සඳහා සානුබලයක් ලබා නොදෙයි. ඒ අනුව දීර්ඝකාලීන සහනාධාර ලබා දීම වෙනුවට කාල රාමුවක සවිබල ගැන්වීමේ කාර්‍යයට ප්‍රතිලාභීන් නතුකර ගැනීම තුළ නිළධාරීන්ගේ හා ප්‍රතිලාභීන්ගේ කාර්යක්‍ෂම ප්‍රවේශයක් තුළින් දරිද්‍රතාව අවම අගයකට ආර්ථිකය යොමු කළ හැකිය.

**ආශ්‍රිත ග්‍රන්ථ**

අත්පත්තු, ඩී. (2011)"ආර්ථික විද්‍යා ප්‍රවේශය 2", කර්තෘ ප්‍රකාශන.

අබේසිංහ, ඒ. එම්. ජී. බී. (2011),"සමුපකාරය ප්‍රජා සංවර්ධනය හා කාන්තා සහභාගිත්වය", ආරිය ප්‍රකාශකයෝ,බෞද්ධ විද්‍යාල මාවත, වරකාපොල.

අමරසේකර, ඩී. (1988), "ශ්‍රී ලංකා සමාජය", ආරිය ප්‍රකාශකයෝ, බෞද්ධ විද්‍යාල මාවත, වරකාපොල.

ගමගේ, එස්.අයි. (1998),"ශ්‍රී ලංකාවේ ආර්ථික සංවර්ධනය", ඇම්.ඩී. ගුණසේන සහ සමාගම, කොළඹ 11.

ප්‍රනාන්දු, ඩී. (2011),"ප්‍රජා මූල වැඩසටහනක් ලෙස සමෘද්ධි වැඩසටහන", සමෘද්ධි බැංකු සංගමය, කොළඹ.

හීදැල්ල ආරච්චි. (1998),"ශ්‍රී ලංකාවේ ආර්ථික සංවර්ධනය", ඇම්. ඩී. ගුණසේන සහ සමාගම, කොළඹ 11.